
මාධ්‍යවේදීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන




# 2024 අගෝස්තු
# මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඇතුළත් විශේෂ කරුණු

**2024 අගෝස්තු 16**

*ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව*
*ශ්‍රී ලංකා මහ බැංකුව*

# මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඇතුළත් වන්නේ කුමක්ද?


- ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව
- මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ සාරාංශය
- මුදල් ප්‍රතිපත්ති සාරාංශය
- උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම
  - *මූලික පුරෝකථන*
  - *පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන*
  - *උද්ධමනය සහ ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම්*
- වර්තමාන ආර්ථික තත්ත්වය
  - *දේශීය ආර්ථිකයේ විවිධ අංශවල සහ ගෝලීය ප්‍රවණතා*

*මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ප්‍රධාන අරමුණ*

*මීට අමතරව,*

*"නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමන ඉලක්කය" පිළිබඳ විශේෂ සටහනක් ඇතුළත් වේ*

# ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව සිය ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමට කටයුතු කළේය...





**“ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන යමින් 2024 වසරේ දී පමණක් ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 75කින් අඩු කළේය”**

“2023 වසරේ දී ද ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 650කින් සැලකිය යුතු ලෙස පහළ දැමීය”

| 2024 මාර්තු | 2024 මැයි | 2024 ජූලි |
|---|---|---|
| ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් 8.50%ක් (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය) සහ 9.50%ක් (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) දක්වා අඩු කරන ලදී. | ප්‍රතිපත්ති පොලී අනුපාතික 8.50% (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය) සහ 9.50% (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) යන මට්ටමේ නොවෙනස්ව පවත්වාගෙන යන ලදී. | ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25කින් 8.25% (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය) සහ 9.25% (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) දක්වා තවදුරටත් අඩු කරන ලදී. |

# බලශක්ති මිල ගණන් පහළ දමමින් සිදුකරන ලද සංශෝධන මෑත මාසවල උද්ධමනය පහළ යෑමට උපකාරී වී ඇත...

වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි. ද.)





**ආහාර උද්ධමනය පහළ යෑම සහ අඩු ඉල්ලුම් තත්ත්වයන් ද මතුපිට උද්ධමනය අඩු වීම සඳහා දායක විය**

මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකු කාර්‍ය මණ්ඩල ගණනය කිරීම්

# මතුපිට උද්ධමනය නුදුරු කාලීනව තවදුරටත් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ...

**මතුපිට උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)**

***2024 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව***




*සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනෙහි 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.*

- 2025 වසරේ පළමු කාර්තුව දක්වා උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතිය හැකිය
- 2025 වසරේ දෙවන භාගයේ දී උද්ධමනය තාවකාලිකව වැඩි විය හැකි අතර ඉන් අනතුරුව ඉලක්කගත සියයට 5ක මට්ටමේ ක්‍රමයෙන් ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ

# උද්ධමන පුරෝකථන මත පවතින අවදානම්...

## ඉහළ යෑමේ අවදානම් ⬆

- ඉහළ වැටුප් සඳහා වන ඉල්ලුම් සාක්ෂාත් කර ගැනීමේ හැකියාව
- අයහපත් කාලගුණික/දේශගුණික තත්ත්වයන් කෘෂිකාර්මික නිෂ්පාදනයට ඇති විය හැකි අහිතකර බලපෑම්
- රුපියල අවප්‍රමාණය වීමේ හැකියාව
- අවිනිශ්චිතතාවය මධ්‍යයේ ගෝලීය බනිජතෙල් සහ ආහාර මිල ඉහළ යෑමට ඇති පීඩන


## පහළ යෑමේ අවදානම් ⬇

- මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ දිගු කාලීන බලපෑම
- අපේක්ෂා කළ මට්ටමට වඩා වැඩි බලශක්ති මිල අඩු වීමෙහි වක්‍ර බලපෑම් මගින් වෙනත් භාණ්ඩ හා සේවාවල මිල මට්ටම අඩු වීමේ හැකියාව

ආර්ථික වර්ධන ප්‍රවණතාව නුදුරු කාලයේ දී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂිත අතර, මැදි කාලීනව එහි උපරිම ධාරිතාව කරා ක්‍රමයෙන් ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ...

කාර්තුමය මූර්ත ද.දේ.නි.යේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)

*2024 වසරේ ජූලි මස පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව*




සුදුසු ප්‍රතිපත්තිවල සහාය ඇතිව ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත් වීම මැදි කාලීනව අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ

# අවදානම්වල සමස්ත දිශානතිය...


| | නුදුරු කාලීන | මැදි කාලීන |
|---|---|---|
| උද්ධමන පුරෝකථන | ඉහළ යෑමේ වැඩි ප්‍රවණතාවක් ඇත | ඉහළ සහ පහළ යෑමේ ප්‍රවණතාවය තුලිතව පවතී |
| ආර්ථික වර්ධන පුරෝකථන | ඉහළ සහ පහළ යෑමේ ප්‍රවණතාවය තුලිතව පවතී | ඉහළ සහ පහළ යෑමේ ප්‍රවණතාවය තුලිතව පවතී |

# විශේෂ සටහන


# නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමන ඉලක්කය...

- මුදල් ප්‍රතිපත්ති රාමුවේ විකාශනය
- නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව උද්ධමන ඉලක්කය

## මෙම රූප සටහන සඳහා උපකල්පිත උද්ධමන ඉලක්ක භාවිත කෙරේ




"කාර්තුමය මතුපිට උද්ධමනය, ඉලක්කගත උද්ධමන මට්ටමට වන 5% මට්ටමට වඩා **අඛණ්ඩව කාර්තු දෙකක් තුළ** ඉහළ හෝ පහළ ආන්තික මට්ටමින් සියයට 2ක ප්‍රතිශතාංකයකට වඩා වැඩි ප්‍රමාණයකින් වෙනස් වන්නේ නම් එය ඉලක්කය කඩවීමක් ලෙස සැලකේ"


මුදල් ප්‍රතිපත්ති
වාර්තාව
2024 අගෝස්තු
ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ස්තුතියි